**ශ්‍රී ලංකා තේ මණ්ඩලය - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

---

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

## 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 පරිදි සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් අලාභයට ගැලපීම් කළ යුතු වුවත්, මණ්ඩලය විසින් ප්‍රත්‍යාගණන අතිරික්තයද ගැලපීමෙන් පසු එළඹි ලාභයට ගැලපීම් කර තිබුණි. තවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් චලනයට බලනොපාන ලද අයිතම් වශයෙන් තේ ප්‍රවර්ධන සහ අලෙවිකරණ බදු අරමුදලෙහි ආදායම් බදු වෙන්කිරීම් රු. 144,758,895 ක් සහ ස්ථාවර වත්කම් ගැලපුම් වශයෙන් රු. 14,521,855 ක් ද 2019 වර්ෂයට අදාළ පුස්තකාල පොත් වෙනුවෙන් වූ රු. 53,350 ක ක්ෂය වියදමද පසුගිය වර්ෂයට අදාළව ප්‍රවර්තන වර්ෂයේදී සිදුකළ රු. 653,262 ක ගැලපීම්ද මෙහෙයුම් ප්‍රතිඵලයට ගැලපුම් කර තිබුණි. | විමසුම පිළිගනිමි. නිවැරදි කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පිටපතක් ඉදිරිපත් කර ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |
| (ආ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට සම්පූර්ණයෙන් ක්ෂය කරනු ලැබූ පිරිවැය රු. 119,194,204 ක් වූ රසායනාගාර උපකරණ, කාර්යාල උපකරණ, යන්ත්‍ර හා උපකරණ, ජලය, විදුලිය හා උපකරණ, සැරසිලි උපකරණ | ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කිරීම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව හා අභ්‍යන්තර කමිටුවක් මඟින් ප්‍රත්‍යාගණනය කර | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| හා පුස්තකාල පොත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව එම වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | ගිණුම්වල ගැලපිලි සිදු කරන ලදී. රසායනාගාර උපකරණ සඳහා විශේෂඥ සහාය මත ප්‍රත්‍යාගණනය සිදු කරන ලදී. එම වාර්තාව ලැබුණු පසු 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රත්‍යාගණන ගැලපිලි සිදු කරනු ඇත. | |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 36 ඡේදය අනුව දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම අයත්වන දේපළ පිරියත හා උපකරණ පන්තියම මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් කාර්යාල උපකරණ, යන්ත්‍ර හා උපකරණ සහ ලී බඩු හා සවිකිරීම් ප්‍රත්‍යාගණනය කිරීමේදී ප්‍රධාන කාර්යාලයට අයත් එම වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | ප්‍රමිතියේ 36 ඡේදය අනුව ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ වත්කම් පන්තියම මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කර ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 ට අනුකූලව යම් වත්කමකට අයත් මුළු වත්කම් පන්තියම මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 වර්ෂයේදී තේ ප්‍රවර්ධන සහ අලෙවිකරණ බදු අරමුදලින් රු.මිලියන 1,000 ක් ද 2020 වර්ෂයේදී තවදුරටත් එම අරමුදලේ අතිරික්ත මුදල් රු .මිලියන 509.62 ක් ද මහා භාණ්ඩාගාරය වෙත මණ්ඩලය විසින් ලබාදී තිබුණු අතර මෙම මුදල් මූල්‍ය ප්‍රකාශනයේ ලැබිය යුතු ණය ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එසේ වුවද, මහා භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රකාශන තුළ මෙම ශේෂ ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත ගෙවිය යුතු ශේෂයන් ලෙස ගිණුම්ගත කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂ සනාථයන්ද ඉදිරිපත් කර නොතිබුණි. | මෙම මුදල් ඒකාබද්ධ අරමුදල වෙත පවරා ගැනීම සම්බන්ධ ලිපි ඉදිරිපත් කර ඇත. | ලැබිය යුතු ශේෂයක් නොවන හෙයින් ගිණුම් වල ගැලපීම් කර නිවැරදි කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේ ජුනි මස 10 සහ 11 යන දිනයන්හිදී ඇමෙරිකාවේදී පැවැත්වීමට නියමිතව තිබූ ලෝක තේ වෙළඳ ප්‍රදර්ශනයේ ප්‍රදර්ශන කුටි වෙන්කරවා ගැනීම වෙනුවෙන් 2020 ජනවාරි 08 දින රු. 4,474,728 ක් (USD $ 24,395) එක්සත් ජනපදයේ චිකාගෝ නුවර පිහිටි පුද්ගලික ආයතනයක අංක 811104744 දරන බැංකු ගිණුමට ප්‍රේෂණය කර තිබුණි. කෙසේ වෙතත් ඒ වන විට පැවති ගෝලීය කොරෝනා තත්ත්වය මත මෙම ප්‍රදර්ශනය නොපැවැත්වීමට ප්‍රදර්ශන කමිටුව තීරණය කර තිබුණු අතර 2020 අගෝස්තු 29 දින විද්‍යුත් තැපැල මඟින් මෙම ගෙවා ඇති මුළු මුදලම ආපසු නොගෙවා 2021 ජුලි මස 14, 16 දිනයන්හිදී පැවැත්වීමට නියමිත ලෝක තේ වෙළඳ ප්‍රදර්ශනය වෙනුවෙන් ප්‍රදර්ශන කුටි වෙන්කරවා ගැනීමට බැර කරන ලෙස මණ්ඩලය විසින් ඉහත ආයතනයට දැනුම් දී තිබුණි. එසේ තිබියදී මෙම අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂයේ වියදමක් වශයෙන් ගිණුම් ගත කර තිබුණි. තවද මෙම වියදම තහවුරු කරගැනීම සඳහා අවශ්‍ය ලදුපත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | අධ්‍යක්ෂ ප්‍රවර්ධනගේ ලිඛිත නිර්දේශ පරිදි අරමුදල් ප්‍රේෂණය කිරීමේදී අදාළ මුදල් වියදම් ලෙස ගිණුම් ගත කිරීම නිසා මෙම ගැටලුව උද්ගත වී ඇත. ඉදිරියේදී අදාළ අරමුදල් අත්තිකාරම් ලෙස ගිණුම් ගත කිරීමටත් වියදම් ලේඛණ ලැබුණු පසුව වියදම් ලෙස ගිණුම් ගත කිරීමටත් උපදෙස් ලබා දුනිමි. වියදම් තහවුරු කර ගැනීම සඳහා අදාළ ගෙවීම් වවුචරය ලේඛණ හා 2021/505/97 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ පිටපතක් ඉදිරිපත් කරමි. | පළමුව අත්තිකාරම් ලෙස ගිණුම් ගත කර වියදම් දැරූ පසු වියදම් ලෙස ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) පුහුණු පාඨමාලා වියදම් සඳහා 2019 දෙසැම්බර් 31 දිනට උපචිත කරන ලද රු. 2,280,165 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා එම ප්‍රමාණය උපචිත වියදම් ගිණුමට හර කරනු වෙනුවට වියදම් ගිණුම හර කර තිබුණි. ඒ අනුව වියදම් ගිණුම සහ උපචිත වියදම් ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී අදාළ නිවැරදි ගැලපුම් සිදු කරන ලදී. | ගනුදෙනු හා සිද්ධීන් නිවැරදිව අදාළ ගිණුමට ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) ප්‍රධාන කාර්යාලයේ තේ අළෙවි සැළෙහි අළෙවි කරනු ලබන තේ, පාරිභෝගිකයන්ට නිකුත් කිරීමේදී ඒවා බහාලීම සඳහා පුද්ගලික ආයතනයකින් “ ඇණවුම් අංක 18829 ” යටතේ 2018 වර්ෂයේදී සැපයුම් කරන ලද රු. | ගබඩාවේ 2018.10.25 දින සිට 2019.04.04 දින දක්වා පවත්වාගෙන ගිය ලෙජරය 2018 වර්ෂය අවසාන තොග සත්‍යාපනයේදී සහ 2019.04.04 දින තොග සත්‍යාපනයේදී මුදල් අංශය වෙත ඉදිරිපත් කර ඇත. | ආපසු හරවා යැවීම නිසා ණයහිමි ශේෂය අඩුවන බැවින් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| 3,645,000 ක කුඩා හා විශාල කඩදාසි කවර 30,000 ක් සම්බන්ධයෙන් නියමිත ආකාරයෙන් තොග සටහන් පවත්වාගෙන යාම සිදු වී නොතිබූ බව නිරීක්ෂණය විය. සියලුම හානි වූ සහ දෝෂ සහිත කවර සැපයුම්කරු වෙත ආපසු බාර දී තිබියදී සැපයුම්කරුට ගෙවිය යුතු මුදල් ලෙස රු. 1,404,640 ක් 2020 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් යටතේ දක්වා තිබුණි. | පළුදු වූ කඩදාසි බෑග් සැපයුම්කරුට නිකුත් කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලද අතර පළුදු වූ බෑග් නැවත සකස් කර ගබඩාවට ඉදිරිපත් කළ විගස ඒ සඳහා ගෙවීම් කිරීමට කටයුතු කරනු ඇත. | |
| (ඉ)සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී ආදායම රු. 207,342,040 ක් ජංගම වත්කම් යටතේ ලැබිය යුතු පොලී ලෙස දක්වනු වෙනුවට ස්ථාවර තැන්පතු ආයෝජන යටතේ දක්වා තිබුණි. | අතපසුවීමකින් ආයෝජන උපලේඛන යටතේ පෙන්නුම් කර ඇත. කෙසේ නමුදු 2021 වර්ෂයේදී ලැබිය යුතු පොලි හා ලැබුණු පොලි නිවැරදි ආකාරයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ පෙන්නුම් කරනු ලැබේ. | ලැබිය යුතු පොලී ආදායම ජංගම වත්කම් යටතේ දැක්විය යුතුය. |
| (ඊ) 2019 වර්ෂයේ ආදර්ශ තේ ඉඩම් පිහිටුවීමේ වැඩසටහන යටතේ සහනාධාරලාභියෙකු වෙත නිකුත් කරන ලද ලංකා බැංකුවේ අංක 562353 දරන චෙක්පත මඟින් ගෙවන ලද රු. 300,000 ක සහනාධාර මුදල එම ව්‍යාපෘතිය සඳහා ඔහුගේ අකමැත්ත ප්‍රකාශ කිරීම නිසා ආපසු ගෙවා තිබූ අතර එම රු. 300,000 ක මුදල අදාල වියදම් ගිණුම බැර කිරීම වෙනුවට තවදුරටත් සහනාධාරලාභියා වෙත ගෙවිය යුතු මුදලක් ලෙස 2020 දෙසැම්බර් 31 වන දිනට ගිණුම්වල ඇතුළත් කර ඇති බව නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේදී අදාළ නිවැරදි කිරීමේ ගැලපුම් සිදු කරන ලදී. | ගනුදෙනු හා සිද්ධීන් නිවැරදිව අදාළ ගිණුමට ගිණුම්ගත කළ යුතුය. |

## 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) | | |
| (අ)රසායනාගාර ආදායම | 2,461,600 | 7,050,200 | 4,588,600 | සාම්පල් පරීක්ෂා කොට අසමත් වන සාම්පල් සඳහා පමණක් රසායනාගාරය විසින් ඉන්වොයිස් පත්‍ර සමග මුදල් අය කර ගැනීමට මුදල් අංශය වෙත යොමු කිරීමට තේ කොමසාරිස් අංශය වෙත යොමු කරනු ලැබේ. කෙසේ නමුදු මුදල් අංශය, රසායනාගාරය සහ තේ කොමසාරිස් අංශය සතු ලේඛන සැසඳීමේ ක්‍රියාවලියක් සිදු නොවන නිසා මෙවැනි වෙනසක් දක්නට ලැබේ. කෙසේ නමුදු මුදල් අංශයේ සටහන් කරනු ලබන ආදායම සත්‍ය හා නිවැරදි වේ. | වෙනසට හේතු සොයා නිවැරදි කළ යුතුයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ)ලිපිද්‍රව්‍යතොගය | 8,628,347 | 6,912,816 | 1,715,531 | විමසුමේ සඳහන් වෙනසට හේතුව සාවද්‍ය ලෙස සටහනක් ගිණුම් ගත කර තිබීමයි. මෙය ජර්නල් සටහනකින් නිවැරදි කර ඇත. | වෙනසට හේතු සොයා නිවැරදි කළ යුතුයි. |
| (ඇ)හිස් ඇසුරුම් පෙට්ටි තොගය | 3,553,486 | 4,674,398 | 1,120,912 | ඇසුරුම් තොගයේ වෙනසට හේතුව විස්තරාත්මකව පරීක්ෂා කොට නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වෙනසට හේතු සොයා නිවැරදි කළ යුතුයි. |

### 1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දේශීය පරිභෝජනය සඳහා හෝ අපනයනය කිරීම සඳහා හෝ තේ ඇසුරුම් කිරීමෙහිලා නිරත සියලු ඇසුරුම්කරුවන් සම්බන්ධයෙන් අංක 386 / 13 සහ 1986 ජනවාරි 28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද නියෝග අදාළ වන අතර එහි අංක 04 හා 06 වගන්ති ප්‍රකාරව ලියාපදිංචි ගාස්තුව රු. 1000 ක මුදල හා ලියාපදිංචිය අලුත්කිරීමේ ගාස්තුව රු. 500 ක මුදල විධිමත්ව සංශෝධනය කර නොමැති වුවද මණ්ඩලය ලියාපදිංචි ගාස්තුව සංශෝධනය කිරීමටත් ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු අය නොකිරීමටත් කටයුතු කර ඇති බැවින් 2015 වර්ෂයේ සිට දේශීය තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචිය අලුත්කිරීමේ ගාස්තු ආදායම මණ්ඩලයට අහිමි වී තිබුණු අතර 2020 වර්ෂයේදී විධිමත් අනුමැතියකින් තොරව අයකළ ලියාපදිංචි ගාස්තුව රු. 1,303,800 ක් වේ. | දේශීය විකුණුම්කරුවන් සඳහා වන ලියාපදිංචි ගාස්තු නිසි අනුමැතියකින් තොරව අය කර ඇති නමුදු පසුකාලීනව තේ කොමසාරිස්ගේ අනුමැතියට අනුව ලියාපදිංචි ගාස්තු අය කිරීම් සිදු කර ඇත. | අමාත්‍යවරයා විසින් අතිවිශේෂ ගැසට් පත්‍රයක් මගින් ගාස්තු සංශෝධනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ)2020 වර්ෂය අවසානයට මණ්ඩලයෙහි ලියාපදිංචි මුළු දේශිය තේ ඇසුරුම්කරුවන් සංඛ්‍යාව 758 ක් වූ අතර ඉන් 2020 වර්ෂයේ ලියාපදිංචි නව ඇසුරුම්කරුවන් හැර ඉතිරි ඇසුරුම්කරුවන් සංඛ්‍යාව 538 ක් වේ. එම ප්‍රමාණයෙන් 212 ක් පමණක් ලියාපදිංචිය අලුත් කර තිබූ අතර එය මුළු ප්‍රමාණයෙන් සියයට 28 කි. එම නිසා ලියාපදිංචිය අලුත්කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයෙහි අධීක්ෂණය සතුටුදායක මට්ටමක නොපැවති බව නිරීක්ෂණය වේ. | කොවිඩ් - 19 වසංගත තත්වය හේතුවෙන් දේශීය ඇසුරුම්කරුවන්ගේ ලියාපදිංචිය අලුත් කිරීම පහත වැටී තිබේ. එසේම ලියාපදිංචිය අලුත් කරන ලෙස සැපයුම්කරුවන් වෙත ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙබ් පිටුවේද දැන්වීම් පල කරන ලදී. | දේශීය තේ ඇසුරුම්කරුවන් ගේ ලියාපදිංචිය අලුත් කිරීම සම්බන්ධයෙන් මණ්ඩලය නිසි අධීක්ෂණයක් කළ යුතුයි. |
| (ඇ)උක්ත (අ) හි දැක්වෙන අති විශේෂ ගැසට් පත්‍රයේ 06 වගන්තිය ප්‍රකාරව ඇසුරුම් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නිරත වීම සඳහා අවශ්‍ය සෑම ලියාපදිංචි කිරීමක්ම එක් එක් වර්ෂයේ ජනවාරි 31 වන දින හෝ ඊට පෙර සිදු කරනු ලැබිය යුතුය. එසේම 08 වන වගන්තිය අනුව සෑම ලියාපදිංචි ඇසුරුම්කරුවෙකු විසින්, අඩංගු තේ වල නියෝජිත සාම්පලයක් සමඟ සිල්ලර ඇසුරුම් බඳුනේ සාම්පලයක් ද මණ්ඩලය වෙත සැපයිය යුතුය. එසේ වුවද දැනට මණ්ඩලයේ ලියාපදිංචි වී සිටින ඇසුරුම්කරුවන් ඒ අනුව කටයුතු කිරීමෙන් තොරව ව්‍යාපාර කටයුතු සිදුකරන අවස්ථා නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. තවද 2013/ 420 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ සඳහන් පරිදි දේශීය පරිභෝජනයට සුදුසු තේ පිළිබඳ සෑම මාස තුනකට වරක් සිදු කළයුතු නියාමන කටයුතුවල වාර්තා කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මේ හේතුවෙන් දේශීයව පරිභෝජනය සඳහා යෝග්‍ය නොවන තේ වෙළඳපල තුළ අලෙවි වීමට අවස්ථාව ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | ව්‍යාපාර කටයුතුවල නියැලෙන්නේ නැති ලියාපදිංචි අසුරුම්කරුවන් හැරුණුවිට සෙසු අසුරුම්කරුවන් ලියාපදිංචි ඉල්ලුම්පත්‍ර සමඟ සාම්පල ඉදිරිපත් කරනු ඇත. | ව්‍යාපාර කටයුතු වල නියැලෙන්නේ නැති බවට සනාථ කිරීමක් ලබාගත යුතු අතර සෙසු ලියාපදිංචිකරුවන් සාම්පල් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | භූමි ප්‍රමාණය අක්කර 10 ට වැඩි මධ්‍යම පරිමාණ සහ මහා පරිමාණ වතු ක්ෂේත්‍රය ආවරණය කරගනිමින් අවම පැළ ධාරිතාවය තේ පැළ ලක්ෂයක් වන තේ පැළ තවාන් 138 ක් සඳහා සහ කුඩා පරිමාණ තේ පැළ තවාන් 500 ක් පිහිටුවීමට කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට රු. මිලියන 250 ක්ද ඇතුළුව එකතුව රු. මිලියන 450 ක් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ප්‍රවර්ධන සහ අලෙවිකරණ බදු අරමුදලින් මුදල් ලබාදීමට තීරණ අංක 2020/ 491/ 45 සහ 2020/498/238 මඟින් අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර තිබුණි. 2010 ඔක්තෝබර් 27 දිනැති හා අංක 1677 / 14 දරන තේ ප්‍රවර්ධන සහ අලෙවි ක්‍රමෝපාය සඳහා බදු එකතු කිරීම ගැසට් නියෝගය අනුව තේ ප්‍රවර්ධනය සහ අලෙවිකරණ බදු අරමුදලේ මුදල් ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත තේ ප්‍රවර්ධනය සහ අලෙවි ක්‍රමෝපායට අදාළ කටයුතුවල නියුක්තවීමේ කාර්යය සඳහාම පමණක් භාවිත කළයුතුව ඇති හෙයින් මෙම වියදම තුළින් ඉහත නීතිය උල්ලංඝනය කර තිබුණි.<br>එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මෙම මුදල පොලී රහිත ණය මුදලක් සේ නිකුත් කිරීමට තීරණය කර තිබුණද කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට 2020 අගෝස්තු 31 දින ගෙවන ලද රු.මිලියන 75 ක මුදල සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර දෙපාර්ශවය අතර කිසිදු අවබෝධතා ගිවිසුමකට එළඹ නොතිබුණි. | 2013 වර්ෂයේ වැඩිම ජාතික තේ නිෂ්පාදනය සටහන් වූ අතර එය කිලෝග්‍රෑම් මිලියන 340ක් ලෙස සටහන් වූ අතර 2020 වර්ෂයේ නොවැම්බර් අග වන විට කිලෝග්‍රෑම් 250ක් ලෙස සටහන් වී ඇති අතර එය 2019 වර්ෂයට සාපේක්ෂව කිලෝග්‍රෑම් මිලියන 28ක අඩුවීමක් වන අතර ප්‍රතිශතයක් ලෙස ගත් කළ 10% ක අඩුවීමකි.<br><br>තේ ප්‍රවර්ධනයද තේ කර්මාන්තයේ අගය දාමයට (Value Chain) ඇතුළත් වන අතර එහි අලෙවිකරණය යනු සීමිත කොටසක් පමණි. මූලික නිෂ්පාදනයට අත් වී ඇති පසුබෑමට දිගුකාලීන පිළියම් ලබා නොදීම මත අගය දාමය සංකෝචනය වීම නිසා ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය දැඩි පසුබෑමකට ලක් ව ඇත. මෙය අරමුදලෙන් බැහැරව මුදල් යෙදවීමක් නොවන අතර එය කර්මාන්තයේ වර්තමාන උන්නතිය උදෙසා ලබා ගත් කාලෝචිත තීරණයක් බව දැක්විය හැක. තවද අදාළ අරමුදල් දිගුකාලීන ණය යෝජනාවක් ලෙස ලබාගන්නා අතර එය 2020/491/45 හා 2020/498/238 යන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවන්හි පැහැදිලිව සටහන් වන අතර අදාළ ණයෙහි වාරික තේ නැවත වගා කිරීමේ අරමුදලෙන් ගෙවීමට සැලසුම් කර ඇත. | තේ ප්‍රවර්ධන සහ අලෙවිකරණ බදු අරමුදලේ අරමුණින් බැහැරව මුදල් වැය නොකළ යුතුය. |
| (ඉ) | ක්‍රියාකාරකම් පදනම් කරගත් පිරිවැය ක්‍රමයක් (Activity Based Costing System) ස්ථාපිත කිරීම සඳහා ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදුකර නොතිබියදී උපදේශක ගාස්තු සඳහා රු.850,000 ක් උපචිත වියදමක් ලෙස ගිණුම්ගත කර ඇති බව නිරීක්ෂණය විය. | ඓතිහාසික පිරිවැය අවශෝෂණ ක්‍රමය යල් පැන ගිය පිරිවැය හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් නිසා ඊට විකල්පයක් වශයෙන් ක්‍රියාකාරකම් පදනම් කර ගත් පිරිවැය ක්‍රමය හඳුන්වාදීම සුදුසු බැව් මා සහභාගී වූ ජනාධිපති කාර්ය සාධන විද්වත් හමුවකදී සාකච්ඡා කළ අතර ABC ක්‍රමය ශ්‍රී ලංකා තේ මණ්ඩලය තුළ ක්‍රියාත්මක කළ යුතු බැව් මා විසින් යෝජනා කරන ලදී. මෙම තීරණය 2020 අගදී ගනු ලැබුවත් සම්පත් දායකයකු හඳුනා ගැනීම හා | ලබා නොගත් සේවාවන් වෙනුවෙන් වෙන්කිරීම් සිදු නොකළ යුතුය. |

| | | |
|---|---|---|
| | මූලික සාකච්ඡා ප්‍රමාද වූයෙන් ක්‍රියාත්මක කිරීම 2021 වර්ෂයේදී සිදු කිරීමට පියවර ගන්නා ලදී. | |
| (ඊ)1975 අංක 14 දරන තේ මණ්ඩල පනතේ 25(1) වන වගන්තිය අනුව මණ්ඩලය විසින් නියෝග සෑදිය හැකි අතර 25 (3) වගන්තිය අනුව මණ්ඩලය විසින් සාදනු ලැබූ කිසිම නියෝගයක්, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවහොත් මිස, වලංගු නොවන්නේය. එසේ වුවද අංක OR/1/87 හා 2010 අගෝස්තු 06 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය මගින් මණ්ඩලය ගාස්තු සංශෝධනය කර සංශෝධිත ගාස්තු සමාලෝචිත වර්ෂය දක්වා අයකර ගැනීමට කටයුතු කර තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 2010/392/94 යටතේ අනුමැතිය මත සංශෝධනය කර ඇති අතර ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පනත් සංශෝධනය කිරීම සඳහා මේ වන විට නීති කෙටුම්පත් සිදුකර ඇති අතර ඒ තුළ අදාළ ගාස්තු සංශෝධනයද දක්වා ඇත. | නීතිපතිවරයාගේ උපදෙස් පරිදි පනත සංශෝධනය කර ගාස්තු සංශෝධනය කළ යුතුය. |
| (උ)2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛනයේ I කොටසෙහි 15.1 (3) ප්‍රකාරව ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු කළ යුතු වුවද මණ්ඩලයේ තේ ප්‍රවර්ධන හා අලෙවිකරණ බදු අරමුදල සම්බන්ධව එසේ කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.තවදුරටත් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අංක PFD/MPI/FD/37 දරන හා 2021.07.22 දිනැති ලිපිය කෙරෙහිද අවධානය යොමු කරේ. | ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතේ පවත්වාගෙන යනු ලබන තේ ප්‍රවර්ධන හා අලෙවිකරණ බදු අරමුදල 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ අනුමත වී ඇති ව්‍යවස්ථාපිත අරමුදලකි. | පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

### 1.6.1 ලැබිය යුතු මුදල්

----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------ | -------------- |
| (අ)හිටපු අමාත්‍යවරයෙකු, අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම්වරයෙකු සහ තේ පර්යේෂණ ආයතනයේ නිලධාරීන් ඇතුළු පිරිසකගේ විදේශ ගමන් වියදම් එකතුව වූ රු. 975,257 ක් වසර 03 සිට 04 දක්වා කාලයක සිට ලැබිය යුතු ශේෂයක් ලෙස පවතින අතර 2021 අප්‍රේල් 30 විගණන දින වන විටත් වැවිලි අමාත්‍යාංශයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම විදේශ සංචාර ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද විදේශ තේ ප්‍රවර්ධන වැඩසටහන සම්බන්ධයෙන් වන නිසා එකී වියදම් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රවර්ධන වියදමක් ලෙස සලකා ගිණුම් ගත කරන ලෙස අමාත්‍යාංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටුවේදී තීරණය විය. අනුමැතිය ලද විගස අදාළ | බාහිර පාර්ශවයකගේ විදේශ ගමන් වියදම් වෙනුවෙන් වැය කළ මෙම මුදල් අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | අය විය යුතු මුදල කපා හැරීමට ක්‍රියා කරනු ලැබේ. | |
| (ආ)කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව සහ වැවිලි අමාත්‍යාංශය යන ආයතනයන්හි නිලධාරීන්ගේ විදේශ ගමන් වියදම් වෙනුවෙන් දැරූ රු. 631,061 ක් වර්ෂ 02 සිට වර්ෂ 03 දක්වා කාලයක සිට ලැබිය යුතු මුදල් වශයෙන් මූල්‍ය ප්‍රකාශනයෙහි දක්වා ඇතත් විගණන දින වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් දරන ලද වියදම අය කර ගැනීම සඳහා කිහිප වරක්ම ලිපි යවා ඇති නමුදු මේ වනතුරු නිරවුල් කර නැත. මෙම මුදල් අය කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | මණ්ඩලයේ වගකිව යුතු නිලධාරීන්ගෙන් හෝ අදාළ ආයතන වලින් අයකර ගත යුතුය. |
| (ඇ)ලැබිය යුතු ආදායම් ශේෂය තුළ ඇතුළත් රු. 261,060 ක් වූ නුවරඑළිය සිලෝන් ටී හවුස් හි ශේෂය වසර 6 ක සිට ඉදිරියට ගෙන එමින් පවතින අතර 2021 අප්‍රේල් 30 විගණන දින වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | Tea House හි 2014 වර්ෂයේ එවකට නිලධාරීන් විසින් ලබා ගත් ආහාරපාන සඳහා ලැබිය යුතු මුදලකි. සනාථ කිරීමට අවශ්‍ය ලේඛන සොයා ගත නොහැකි අතර විගණන හා කළමනාකරණ කමිටුවට යොමු කර සුදුසු පියවර ගැනීමට ක්‍රියා කරනු ලැබේ. | වගකිව යුතු පාර්ශවයන්ගෙන් මෙම මුදල් තේ මණ්ඩලය වෙත අයකර ගත යුතුය. |
| (ඈ)නිෂ්පාදන දෝෂ සහිත හිස් ඇසුරුම් පෙට්ටි වෙනුවෙන් පුද්ගලික ආයතනයකින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු. 1,313,986 ක් එම ආයතනය සමඟ ඇති කරගත් ගිවිසුමේ 4.3 වගන්තිය පරිදි අයකරගත යුතු වුවත් එසේ අය කර ගෙන නොතිබුණි. මෙම ශේෂයෙන් රු.1,312,231 ක් 2019 වර්ෂය තුළදී අයවිය යුතු ශේෂයක් වී තිබුණි. | නිෂ්පාදන දෝෂ සහිත හිස් ඇසුරුම් පෙට්ටි සඳහා ටී ටැන්ග් ආයතනයෙන් රු. 1,315,249.73 ක මුදලක් ඔවුනට ගෙවිය යුතු ඉන්වොයිස් මඟින් අඩු කර ගෙන ගෙවීම් කර ඇත. එහි අඩු කර ගත් ලිපියේ පිටපතක් විගණනයට මේ සමඟ ඉදිරිපත් කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව අප්‍රමාදව අයකර ගත යුතුය. |
| (ඉ) 2012 වර්ෂයේදී සිරියාවේ පැවැත්වීමට නියමිතව තිබී එවකට පැවති යුධ තත්වය නිසා අවලංගු වූ "ෆුඩ් එක්ස් සිරියා" ප්‍රදර්ශනය වෙනුවෙන් 2011 වර්ෂයේදී මණ්ඩලය විසින් විදේශීය පුද්ගලික ආයතනයකට සිදුකළ රු. 629,261 ක ඉදිරියට කළ ගෙවීම් අයකරගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | ලබා දී ඇති මුදල අය කර ගැනීමට ලිපි යැවූ නමුත් එහි ප්‍රගතියක් දක්නට නොලැබුණි. අලාභයක් ලෙස කපා හැරීමට අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) එක්සත් අරාබි එමීර් රාජධානි විදේශ තානාපති කාර්යාලයෙන් හා මොස්කව් විදේශ තානාපති කාර්යාලයෙන් 2017 වර්ෂයේ සිට ලැබිය යුතු පිළිවෙලින් රු. 249,130 ක් හා රු. 203,847 ක මුදල අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | මොස්කව් විදේශ තානාපති කාර්යාලයෙන් ලැබිය යුතු රු. 203,847 ක මුදල 2020/505/99 හා 28.04.2021 අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව 2021 වර්ෂයේදී අලාභයක් ලෙස කපා හැරීමට හා එක්සත් අරාබි එමීර් රාජධානි විදේශ තානාපති කාර්යාලයෙන් ලැබිය යුතු රු. 249,130 ක් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය. |
| (උ) 2017 වර්ෂයේදී ගෝලීය තේ සංග්‍රහය වෙනුවෙන් විදේශ තානාපති කාර්යාල වෙත ලබා දුන් රු.51,604,457 ක මුදලින් රටවල් 15 ක ඉතිරි වූ රු. 1,810,840 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. | රටවල් 04 ක් සමග හැරුණු විට හිඟ මුදල් විදේශ කටයුතු අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමට ලැබී ඇතැම් ශේෂ රජයේ ආදායමට බැර කර ඇත. අරමුදල් ගෙන්වා ගැනීමට ක්‍රියාකරන බව දැනුම් දෙනු ලැබේ. | විශේෂිත කාර්යයන් සඳහා ලබා දුන් අත්තිකාරම් මුදල්, කාර්යය අවසන් වූ වහාම ඉතිරි මුදල් සමග පියවීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2018 හා 2019 වර්ෂයන්ට අදාළ ගමන් වියදම්, ලිපිද්‍රව්‍ය, ඉන්ධන, අතිකාල යනාදිය සඳහා වූ උපචිත වියදම් එකතුව රු. 595,816 ක් 2020 දෙසැම්බර් 31 දින වන විට නිරවුල් කර නොතිබුණි. | විමසුමෙ සඳහන් උපචිත වියදම් තවදුරටත් තබා ගැනීමේ අවශ්‍යතාවයක් නොමැති හෙයින් ආපසු ගැලපුම් කර ඇත. | නිවැරදිව උපචිත වියදම් ඇස්තමේන්තු කළ යුතුය. |
| (ආ)2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වැඩ අවසන් කළ කොන්ත්‍රාත්වලින් රඳවාගන්නා ලද රු. 9,550,530 ක මුදල් ප්‍රමාණයක් වසර 02 ක් ඉක්මවා පැවතියද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | එම කාර්යයන් භාර අංශ ප්‍රධානීන්ගේ නිර්දේශ ලබා ගෙන ගෙවා දැමීමට කටයුතු කරනු ලැබේ. | අදාළ පාර්ශව වෙත කඩිනමින් නිරවුල් කිරීමට හෝ හිමිකම් නොපානබව තහවුරු කරගෙන ආදායමට බැර කිරීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)තේ කම්හල්හිමියන් විසින් හරිත තේ සපයන්නන් වෙත ගෙවීම සඳහා මණ්ඩලයේ තැන්පත් කර ඇති තැන්පතු මුදල් නිසි පරිදි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් වසර 1 සිට 18 දක්වා එනම් 2000 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය සඳහා නිරවුල් නොකරන ලද තැන්පතු ප්‍රමාණය රු. 7,061,339 කි. එය මුළු තැන්පතු ප්‍රමාණය වන රු. 10,597,267 න් සියයට 67 කි. | ඉදිරි මාස 03 ක කාලසීමාව තුළ පුවත්පත් දැන්වීම් මගින් හිඟ දළු මුදල් හිමියන් විසින් සිදු කරන පැමිණිලි සහ සමගාමීව සිදු කරන ලද පරීක්‍ෂණ වලින් අනතුරුව මෙම මුදල් ගෙවා නිම කිරීම හෝ මෙම මුදල් නැවත තැන්පත්කරුවන් වෙත අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතිය යටතේ නැවත ගෙවීමට කටයුතු සිදු කරනු ඇත. | ගෙවිය යුතු පාර්ශව නිවැරදිව හඳුනාගෙන කඩිනමින් නිරවුල් කළ යුතුය. |
| (ඈ) 2015 වර්ෂයේ අමු තේ දළු සඳහා රු. 80 ක අවම මිලක් පවත්වාගැනීම සඳහ දළු සැපයුම්කරුවන්ට ගෙවීම පිණිස මණ්ඩලය වෙත භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු. 6,738,000,000 ක් වූ සහනාධාර මුදලින් 2015 දෙසැම්බර් 31 දිනට ඉතිරි රු. 912,229 ක් ගිවිසුම් ප්‍රකාර භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රඳවාගෙන තිබුණි. | මෙම මුදල B 80 සහනාධාර ක්‍රමය යටතේ ගුරුගොඩැල්ල හා ග්‍රීන් හිල්ටොප් තේ කම්හල්වල පරීක්ෂණ කටයුතු නිම කර ගෙවීම් කරන තුරු ප්‍රධාන කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමට බැර කරන ලෙස සහකාර තේ කොමසාරිස් බදුරලිය විසින් ඒවා ඇති මුදලකි. එය කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉතිරි මුදල් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 13හා 14වගන්ති | පනතේ විධිවිධාන අනුව සෙස් බදු තේ මණ්ඩලයේ අරමුදලකට බැර කළ යුතු නමුත් ඊට පටහැනිව මහා භාණ්ඩාගාරය වෙත බැර කර තිබුණි. | සෙස් බදු මුදල් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා රේගුව වෙත ලබා දී ඇති උපදෙස් පරිදි සෘජුවම මහා භාණ්ඩාගාරය වෙත බැර කරනු ලැබේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| )ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් | මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන කාර්යාලයේ ගබඩාව විසින් බඩු ලේඛන පොත් විධිමත්ව පවත්වා නොතිබුණි. | මණ්ඩලයේ ප්‍රධාන ගබඩාවේ තේ තොග සම්බන්ධව මේ වන විට මූලික විමර්ශනයක් සිදු | මුදල් රෙගුලාසි ප්‍රකාරව බඩු ලේඛන පොත් පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| රෙගුලාසි සංග්‍රහය මු. රෙ. 751 | | කරමින් පවතී. පරිගණක මෘදුකාංගයක් මිලදී ගෙන එමඟින් තොග පාලන කටයුතු සිදු කිරීමට කටයුතු කරමින් පවතී. | |
| ඇ)1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් රු.7,411,248,407 ක් ස්ථාවර හා කෙටිකාලීන තැන්පතුවල ආයෝජනය කර තිබූ නමුත් ඒ සඳහා අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විසින් එකතු කරනු ලබන තේ ප්‍රවර්ධන අරමුදල අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර වඩාත් වාසිදායක රාජ්‍ය බැංකුවක (ලංකා බැංකුව) විටින් විට ආයෝජනය කරනු ලැබේ. | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය අනුව අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ඈ)2018 සැප්තැම්බර් 21 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග | මණ්ඩලයේ අපේක්ෂිත පිරිවිතරයන්ට අනුකූල නොවීම හේතුවෙන් භාවිතයට ගෙන නොතිබූ, 2009 වර්ෂයේදී රු. 32,132,088 ක් වැයකර මිලදී ගන්නා ලද පලිබෝධනාශක රසායනික සංඝටක විශ්ලේෂණ යන්ත්‍රය (Liquid Chromatography Mass Spectrometer) වාර්තාවේ දින දක්වා භාවිතා කර නොතිබුණි. අභ්‍යන්තර විනය පරීක්ෂණය නිම කිරීම සඳහා වර්ෂ 11ක් ගතවී තිබූ අතර විධිමත් විනය පරීක්ෂණයක් සිදු කර අවසන් තීරණයකට එළඹ නොතිබුණි. | ප්‍රසම්පාදනය සම්බන්ධව අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව මඟින් සිදු කරන පරීක්ෂණය සඳහා ප්‍රසම්පාදන ලිපිගොනු එම කොමිසම භාරයට ගෙන ඇති අතර එම ලේඛණවල සහතික පිටපත් ලබාගැනීමට සැලකිය යුතු කාලයක් ගත විය. තවද අදාළ යන්ත්‍රය මිලදී ගැනීමේදී මණ්ඩලීය නිලධාරීන් අතින් යම් අක්‍රමිකතාවයක් සිදු වී ඇත්ද යන්න පිළිබඳව විමර්ශනය කර වාර්තා කිරීම පිණිස තුන්වන වරට 2020.09.22 දින විමර්ශන නිලධාරී යෙකු පත් කරන ලද අතර එම විමර්ශන වාර්තාව 2021 මාර්තු 31 දින පැවති 504 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලද අතර ඒ අනුව එවකට රසායනාගාරයට අනුයුක්තව සේවය කල | අදාළ විමර්ශණය අප්‍රමාදව නිමකර සුදුසු විනය පියවරගත යුතු අතර මෙවැනි අඩුපාඩු නැවත නැවතත් සිදුවීම වැළැක්වීම සඳහා විධිවිධාන යෙදිය යුතුය. |

| | | |
|---|---|---|
| | | සහකාර අධ්‍යක්ෂවරයාට එරෙහිව මේ වන විට චෝදනා පත්‍රයක් නිකුත් කර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. |

**1.8** **බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ සිට පැවත එන රු. 771,552 ක් වූ රඳවාගැනීම් බදු ශේෂය සමාලෝචිත වර්ෂය දක්වා හිලව් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම රඳවා ගැනීමේ බදු ශේෂය 2020 වර්ෂයේ අදායම් බදු වාර්තාවට ඇතුළත් කර අධිභාරයක් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | රඳවා ගැනීමේ බදු ශේෂය නියමිත කාලසීමාව තුළ හිලව් කර ගැනීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 21,447,654 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු රු.2,675,523 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. රු.24,123,177 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රසායනාගාර ආදායම් සියයට 80 කින් සහ මූල්‍ය ආදායම් සියයට 43 කින් හා වෙනත් ආදායම් සියයට 80 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ජංගම අනුපාතය 1: 14 ක ඉහළ අගයක් විය. ප්‍රචාරණ හා ප්‍රවර්ධන අරමුදලේ කෙටිකාලීන ආයෝජන එනම් ස්ථාවර තැන්පතු මුළු ජංගම වත්කම් වලින් සියයට 75 ක් නියෝජනය වීම ඊට බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුව 2011 වර්ෂයේදි ශ්‍රී ලංකාවේ තේ සඳහා වන ගෝලීය තේ වෙළඳපොළ කොටස (World Prod Share) සියයට 18 ක්ව පැවතියදී ඵලදායී ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මත 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ පස් අවුරුදු කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය කිරීම උදෙසා ක්‍රියාත්මක කරන ලද උපායමාර්ගික සැලැස්ම, 2020 දෙසැම්බර් දක්වා අපේක්ෂිත අයුරින් ඉටුකිරීමට නොහැකි වී තිබුණු අතර අන්තර්ජාතික තේ කමිටු ප්‍රවෘත්ති අතිරේකය (Supplementary to International Tea Committee News Bulletin - 2020) අනුව සමාලෝචනය වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ තේ සඳහා වන ගෝලීය තේ වෙළඳපොළ කොටස සියයට 14.6 ක් දක්වා පහළ බැස තිබුණි. | 2012 වර්ෂයේ ලබාදෙන ලද අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව 2012 පෙබරවාරි මස තාක්ෂණික ඇගයීම් කමිටුව හා අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව පත් කරන ලදී. ඒ අනුව අදාළ ටෙන්ඩර් පටිපාටි අනුගමනය කරමින් 2015 අප්‍රේල් මස ප්‍රචාරණ නිර්මාණ සඳහා සහ මහජන සම්බන්ධතා සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව නිර්මාණාත්මක කටයුතු මේ වන විට අවසන් වුවත් මාධ්‍ය මිලදී ගැනීම සම්බන්ධයෙන් බඳවා ගන්නා ලද උපදේශන අංශය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදීම සිදුවන්නේ 2017 නොවැම්බර් මාසයේදීය. ඒ අනුව විදේශ රටවල මාධ්‍ය සමීක්ෂණ කටයුතු හා මාධ්‍ය සැලසුම් මේ වන විට අවසන් කර ඇති අතර ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන රුසියාව හා යුක්‍රේනය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත්තේ ද 2021 අප්‍රේල් මාසයේදීය. ඒ අනුව ඉහත සඳහන් රටවල් දෙක තුළ ගෝලීය සිලෝන් ටී (Ceylon Tea) ප්‍රවර්ධනය ට අවශ්‍ය වැඩ කටයුතු ආරම්භ කර ඇති අතර මෙම වර්ෂය අග භාගයේදී ජපානය හා චීනය යන රටවල මෙම ප්‍රවර්ධන කාර්යයන් ආරම්භ කර ඇත. | ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය කිරීම උදෙසා සකස් කරන ලද උපායමාර්ගික සැලැස්ම කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කාලීනව පියවර ගත යුතුය. |
| (ආ) මණ්ඩලය විසින් 2003 සැප්තැම්බර් 19 දින ලබාදෙන ලද රු. 25,000,000 ක ණය මුදලක් වෙනුවෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්තාන පිහිටි තේ කෞතුකාගාරයේ (Ceylon Tea Museum) අයිතිය අත්කර ගැනීම හා එම ශේෂය කපා හැරීමට ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා තේ මණ්ඩලය 2012 ජුනි 19 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග අනුව තීරණයකට එළඹ තිබූ නමුත්, 2021 | ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ හන්තාන පිහිටි තේ කෞතුකාගාරය පිහිටි ඉඩම ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වන අතර එහි ඉඩම පාවිච්චි කිරීමට අදාළ බදු කුලිය හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය අවස්ථා 02 කදී ලබා දුන් රු. 35,000,000 ක මුදල සඳහා ලැබිය යුතු පොලි මුදල ගණනය කර එකිනෙක හිලව් කර අදාළ ඉඩම් කොටස ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත | දෙපාර්ශවය අතර අයිතිය පවරා ගැනීම, ණය මුදල් ගෙවීම සම්බන්ධයෙන් නිශ්චිත එකඟතාවයකට කඩිනමින් එළඹිය යුතු වේ. ඒ අනුව නිරවුල් කිරීමේ |

| | | |
|---|---|---|
| අප්‍රේල් 30 විගණන දින දක්වා වර්ෂ 08 කට වැඩි කාලයක් ගත වුවද මෙම ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි.<br>තේ කෞතුකාගාරයෙහි අයිතිය පවරාගැනීම හා ණය මුදල් ලබාදීම සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර කිසිදු ගිවිසුමකට එළඹ නොතිබුණි. තවද අංක 2020/ 492/ 65 දරන කළමණාකරන මණ්ඩල තීරණය අනුව 2020 පෙබරවාරි 27 දින ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වතුයායන්හි කම්කරු වැටුප් ගෙවීම සඳහා තේ මණ්ඩලය විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට නැවතත් රු. 10,000,000 ක ණය මුදලක් ලබාදී තිබුණි. | පවරා දීමට ජනවසම සභාපතිවරයා සමග පැවති සකච්ඡාවේදි එකඟ වන ලදී. එහෙත් පසුකාලීනව එකඟ වූ කරුණු වෙනස් කර ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අය විය යුතු ණය මුදලින් රුපියල් මිලියන 01 ක් ජනවසම විසින් ගෙවීම් කරන ලදී. සෙසු හිඟ මුදල ඉදිරි කාලයේදී නිරවුල් කරන බවට දන්වා ඇත. කෙසේ නමුදු මේ පිළිබඳව අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටුවේදී ද සාකච්ඡා කළ අතර ඒ අනුව දෙපාර්ශය සමග ඒකාබද්ධ සාකච්ඡාවක් පවත්වන බැව් අමාත්‍යාංශ ලේකම් ප්‍රකාශ කරන ලදී. පවතින වසංගත තත්වය අඩු වූ විගස මේ පිළිබඳව ක්‍රියා කරන බැව් දන්වමි. | කටයුතු කඩිනමින් සිදු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ තේ අලෙවිසැලෙහි ක්‍රියාකාරීත්වය වසර 06 ක කාලයක් සඳහා රු. 8,162,296 ක බදු මුදලකට ගෙවීමේ හැකියාව පරීක්ෂා කිරීමකින් තොරව පුද්ගලික පාර්ශවයකට පවරා තිබූ අතර, බදු ගිවිසුමට අනුව 2019 මැයි 27 සිට 2020 මැයි 26 දක්වා රු. 100,000 බැගින්ද 2020 මැයි 27 සිට 2021 මැයි 26 දක්වා රු.105,000 බැගින්ද බදු වාරික අයවිය යුතුව පැවතුණද 2020 වර්ෂය සඳහා මාස 03 ක බදුකුලී පමණක් ලැබී තිබුණු අතර 2021 වර්ෂය සඳහා කිසිදු බදු වාරික මුදලක් විගණිත දින දක්වාම ගෙවා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය අනුව බදුකරුගෙන් ලැබිය යුතු ලෙස රු. 900,000 ක් දක්වා ඇති අතර ලැබිය යුතු හිඟ වාරික වටිනාකම රු. 35,000 ක් හා සියයට 1 ක දඩ මුදල්ද වෙළඳසැලේ ජල විදුලි පරිභෝජනය වෙනුවෙන් රු. 99,267 ක මුදලක්ද වාර්ෂික විකුණුම් වලින් සියයට 02 ක මුදලක්ද තේ මණ්ඩලයට ලැබිය යුතු වුවද ගිණුම්වල එම මුදල අඩුවෙන් දක්වා තිබුණි. | 2019 මාර්තු 14 වන දින පැවති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව ටෙන්ඩර්කරුගේ ධාරිතාව පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලබාදී තිබූ නිර්දේශ අභිබවා ටෙන්ඩර්කරුගේ ධාරිතාවය පිළිබඳ සෑහීමකට පත්විය හැකි බව සඳහන් කරමින් අදාළ තීරණ ගෙන ඇත. | හිඟ බදු මුදල් ගිණුම්ගත කිරීම සහ අයකර ගැනීම කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| උපදේශකයකු බඳවා ගැනීම සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටිය තුළ හෝ වෙනත් චක්‍රලේඛයක කිසිදු විධිවිධානයක් නොතිබියදී අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2020 මැයි 15 දින සිට විශේෂිත තේ ප්‍රචාරණ වෘත්තිය උපදේශකවරයකු ලෙස හිටපු අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) ගේ සේවය අමාත්‍ය මණ්ඩල අනුමැතියක් නොමැතිව දීර්ඝකර දීමනා වශයෙන් රු. 1,829,930 ක ගෙවීමක් සිදු කර තිබුණි. | ඔහුගේ සේවය තවදුරටත් එනම් 2020 දෙසැම්බර් 31 දින දක්වා ලබාගැනීමට සුදුසු යැයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කළ අතර අමාත්‍ය මණ්ඩල ආවරණ අනුමැතිය ලබාගත හැකිය යන අපේක්ෂාව මත ඔහුගේ සේවය 2020 දෙසැම්බර් දක්වා ලබාගැනීමට කටයුතු කර ඇත.<br>2020 මැයි 15 දක්වා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත උපදේශන සේවය ලබාගත් අතර ඒ මත පදනම්ව 2020 මැයි 15 දින සිට 2020 දෙසැම්බර් 31 දක්වා සේවා දිගුව ලබාදීමට කටයුතු කරන ලදී. | පූර්ව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන බඳවා ගැනීම් කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තේවල පවත්නා පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණය කිරීම සඳහා රසායනාගාරයේ ස්ථාපිත කර තිබූ යන්ත්‍රය (Gas Chromatography Mass Spectrometer) භාවිතයෙන් ඉවත් කර ඇති බැවින් නව යන්ත්‍රයක් ස්ථාපිත කිරීම සඳහා 2018, 2019 වර්ෂයන්හි රු. 50,000,000 ක අයවැය ප්‍රතිපාදනය කර තිබුණ අතර 2020 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම තුළ රු.60,000,000 ක් ඇස්තමේන්තුගත කර තිබුණද 2021 අප්‍රේල් විගණන දිනය වන විටත් ප්‍රසම්පාදනය නිමකර නොතිබුණි. | 2019 ඇගයීම් කමිටු පත් කර වර්ෂයේ තාක්ෂණ ඇගයීම් කමිටු පත් කර ටෙන්ඩර් කැඳවුවද 2019 වර්ෂයේදී එම ප්‍රසම්පාදනය අවසන් කිරීමට නොහැකිවීම සහ 2020 වර්ෂයේදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් විශ්ලේෂණ රසායනාගාරයට අත්‍යාවශ්‍ය වූ LCMS-MS යන්ත්‍රය මිලදී ගැනීමට GCMS යන්ත්‍රය සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන භාවිත කිරීම හේතුවෙන් වඩාත් අවශ්‍යව තිබූ LCMS-MS යන්ත්‍රය මිලදී ගත් අතර GCMS යන්ත්‍රය ප්‍රසම්පාදන කටයුතු සිදු නොකරන ලදී. කෙසේ වුවද 2021.04.08 දිනැතිව 2021 වර්ෂයේ මෙම යන්ත්‍රය මිලදී ගැනීමට තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත් කර ඇත. තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශ ලැබීමෙන් පසු ටෙන්ඩර් කැඳවීමට කටයුතු කරනු ලැබේ. | මණ්ඩලයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ප්‍රසම්පාදනයන් ප්‍රසම්පාදන සැලැස්මට අනුව අප්‍රමාදව සිදුකළ යුතුය. |

## 3.5 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අයත් පිළිවෙලින් රු. 1,900,000 ක් හා රු. 1,800,000 ක් වටිනා කැබ් රථ දෙකක් 2017 නොවැම්බර් 28 දින ජාතික වැවිලි කළමණාකරණ ආයතනය වෙත පරිහරණය සඳහා ලබාදීමට කටයුතු කර තිබුණද 2021 අප්‍රේල් 30 විගණන දින වන විටත් මුදල් අයකර ඉහත වාහනවල නීත්‍යානුකූල අයිතිය පවරාදීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදීද මණ්ඩලයේ ප්‍රවාහන අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා රු. 2,665,121 ක් වැය කරමින් පුද්ගලික කුලී රථ භාවිතා කර තිබුණි. | වැවිලි අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය පරිදි අදාළ වාහන දෙක ජාතික වැවිලි කළමනාකරණ ආයතනය වෙත ලබා දී ඇති අතර ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් තක්සේරු වටිනාකම ගෙවා නිම කළ පසු එහි අයිතිය පවරා දීමට කටයුතු කරනු ලැබේ. එම වාහනවල ඵලදායිතාවය (Economic Efficiency) ඉතා පහත මට්ටමක පැවති බැවින් දැරිය යුතු පිරිවැය සලකා ඒවා විකිණීමට තීරණය කරන ලද අතර පුද්ගලික කුලී රථ භාවිතයේදී තේ මණ්ඩලයේ සංචිත වාහන යොදා ගැනීමට වඩා ශ්‍රී ලංකා තේ මණ්ඩලයට වැය වන පිරිවැය (ඉන්ධන , ධාවන , පිරිවැය , රියදුරු අතිකාල යනාදිය ) සාපේක්ෂව අඩු වන බැවින් ගමන් වාර සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුව කුලී රථ සේවය ලබා ගැනීමට කටයුතු කර ඇත. | මණ්ඩලයට අයත් වාහන වෙනත් ආයතනවලට මුදා නොහළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 322 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 268 ක් වූ අතර ඒ අනුව පුරප්පාඩු 52 ක් සහ අතිරික්ත 02 ක් විය. මෙම පුරප්පාඩු පිරවීමට හෝ සංශෝධනයට කටයුතු කර නොතිබුණි. කොන්ත්‍රාත් පදනමට තනතුරු 08 ක් අනුමත කර තිබුණද එයින් 07 ක් ම පුරප්පාඩුව පැවතුනි. | 2020.02.21 දිනැති කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2020 අනුව සියලු බඳවාගැනීම් අත්හිටුවීම, Covid වසංගතය නිසා අභියෝගතා පරීක්ෂණ පැවැත්වීමට නොහැකි වීම ආදිය නිසා බඳවාගැනීම් සැලසුම් කළ පරිදි කිරීමට නොහැකි විය. අතිරික්ත තනතුරු 02 කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හා 30 (1) අනුව ප්‍රතිව්‍යුහගතකරණයේදී දරන්නාට පුද්ගලික වන සේ ලබාදී ඇති තනතුරුය.<br>කොන්ත්‍රාත් පදනම මත තනතුරු 4 ක් සඳහා බඳවාගැනීමේ පටිපාටි සංශෝධනය අනුමත කළ යුතු වීම, ගෝලීය තේ ප්‍රචාරණ වැඩසටහනෙහි සැලසුම අනුව ග්‍රැපික් ඩිසයිනර් තනතුර ඉදිරියේදී පිරවිය යුතු වීම, සහ තවත් කොන්ත්‍රාත් තනතුරු කිහිපයකටම ස්ථිර තනතුරු ඇති කිරීමට කටයුතු කරන අතර 2021 අවසන් කාර්තුවේදී හා 2022 මුල් කාර්තුව තුළදී සියලුම පුරප්පාඩු පිරවීමට අපේක්ෂා කරනු ලබන බව දන්වමි. | අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව මණ්ඩලයේ අරමුණු ඉටු කරගැනීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට හෝ බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනයට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක පීඑෆ්/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව 6.5.3 වගන්තියෙන් බැහැරව 2018, 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාවන් විගණිත දින දක්වාම පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. එසේම චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | 2018 වාර්ෂික වාර්තාව 2021.04.07 දින පාර්ලිමේන්තු සභානායක කාර්යාලයට භාරදෙන ලදී. 2019 වාර්ෂික වාර්තාවට 2021.09.25 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.<br>2020 වාර්ෂික වාර්තාව කෙටුම්පත් කිරීම Covid වසංගතය හේතුවෙන් ප්‍රමාද විය. මෙම මස අවසන් වන විට කෙටුම්පතක් සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුත සිදු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණන අංශයේ කාර්යභාරයට ප්‍රමාණවත් නිශ්චිත කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කිරීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කළ යුතුය. |

## 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඒක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය පිළිබඳ “2030 න්‍යාය පත්‍රයට” අනුව මණ්ඩලය විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැළැස්මේ අදාළ වන අරමුණු දක්වා තිබුණද ළඟාකර ගතයුතු ඉලක්ක සහ ඒවායේ ප්‍රගතිය මැනීම සහා සුදුසු දර්ශකද වාර්ෂිකව ළඟාකර ගත යුතු සංධිස්ථානද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ක්‍රියාකාරකම් වෙනුවෙන් භෞතික හා මූල්‍ය ඉලක්ක සඳහන් කර ඇති අතර තිරසර සංවර්ධන ඉලක්ක සඳහා වන දායකත්වය වෙනුවෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත ඉලක්ක ලබාදී නොමැත.<br>ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ ඇති තිරසර සංවර්ධන සභාව විසින් 2030 වන විට වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයෙන් සපුරාගත යුතු අරමුණු සම්බන්ධව සහයෝගය ලබාදෙන්නේ නම්, වාර්ෂික ක්‍රියාකාරකම් හරහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් එම ඉලක්ක ළඟාකර ගැනීමට සිදුවන දායකත්වය ප්‍රතිශතයක් ලෙස ලබාදිය හැක. | 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතට අනුකූල විය යුතුය. |